# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2064/57 - 2018 අප්‍රේල් මස 01 වැනි ඉරිදා - 2018.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**

66 වන වගන්තිය යටතේ නියෝග

බැංකු ව්‍යාපාරයක් කරගෙන යන තැනැත්තෙකු විසින් සිදු කරනු ලැබූ ණය හිමිකමක් වෙනුවෙන් සලකනු ලැබූ නිශ්චිත ප්‍රතිපාදනවලට අදාළව 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 66(2) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලය ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් දිසානායක මුදියන්සේලාගේ ලලිත් අයිවන් දිසානායක වන මවිසින් උපලේඛනයෙහි දක්වා ඇති පරිදි කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද අදාළ විධානයන්ට අනුකූලව ණය හිමිකමක් වෙනුවෙන් සලසනු නිශ්චිත ප්‍රතිපාදන මෙම නිවේදනය මගින් නිශ්චිතව දක්වා සිටිනු ලැබේ.

ඩී. එම්. එල්. අයි. දිසානායක,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2018 අප්‍රේල් මස 01 වැනි දින,
කොළඹ 02,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

(1) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද අදාළ විධානයන්ට අනුකූලව ණය පහසුකම්වල අනාගත අවදානමට අදාළව සිදු කරන ලද ප්‍රතිපාදන ඉඩදෙනු නොලැබේ.

(2) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද අදාළ විධානයන්ට අනුකූලව මූල්‍ය ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන උකස් ගන්නා ව්‍යාපාරයක උකස් ණයකරුවන්ට අදාළව සිදු කරන ලද ප්‍රතිපාදන ඉඩදෙනු නොලැබේ.

(3) ආශ්‍රිත තැනැත්තෙකු වෙත ලබාදෙන ලද ණය හිමිකමකට අදාළව සිදු කරන ලද ප්‍රතිපාදන ඉඩදෙනු නොලැබේ.

(4) ශ්‍රී ලංකාවෙන් බැහැරව වාසය කරන තැනැත්තෙකු වෙත ලබා දෙන ලද ණය හිමිකමකට අදාළව සිදු කරන ලද ප්‍රතිපාදන ඉඩදෙනු නොලැබේ.

05 - 50

1A - PG 4000 — 432 (2018/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.